ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
பிரதான செயலாளர் அலுவலகம் - தென் மாகாணம்
CHIEF SECRETARIAT - SOUTHERN PROVINCE

| මගේ අංකය / எனது இல. / My Ref. | CSS/8/1/62 | ඔබේ අංකය / உமது இல. / Your Ref. | | දිනය / திகதி / Date | 2023.12. 26 |
|---|---|---|---|---|---|

ප්‍රධාන ලේකම් චක්‍රලේඛ (අයවැය) 03/2023

දකුණු පළාත් සභාවේ සියලුම

ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන්,

ගණන් දීමේ නිලධාරීන් වෙත.

## <u>2024 වර්ෂය තුල වියදම් දැරිම සඳහා බලය දිම හා රාජ්‍ය වියදම් කළමනාකරණය</u>

### 01.<u>වියදම් දැරිම සඳහා අධිකාරි බලය</u>

1987 අංක 42 දරණ පළාත් සභා පනතේ **30** වගන්තිය හා 1990 අංක 28 දරණ පළාත් සභා (සංශෝධන) පනතේ **27** (අ) වගන්තිය අනුව ගරු ආණ්ඩුකාරතුමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, **2024** වර්ෂය වෙනුවෙන් දකුණු පළාත් සභා අරමුදලට අදාළ මුදල් වියදම් කිරීම සඳහා ගරු ආණ්ඩුකාරතුමන් විසින් අධිකාරි බලය ලබා දී ඇත.

ඒ අනුව, ඇස්තමේන්තුවල ප්‍රතිපාදන සලසා ඇති කාර්යයන්, වෙනුවෙන් වියදම් දැරීමේදී ගෙවීම් වවුචර්වල සහ අනෙකුත් ලියකියවිලි මත පහත සඳහන් පරිදි අදාල අධිකාරිය සටහන් කළයුතු වේ.

අ. සාමාන්‍ය පොදු සේවා සඳහා - සාමාන්‍ය වොරන්ට් බලපත්‍රය

ආ.විශේෂ නීති සේවා සඳහා - විශේෂ නීති අධිකාරි බලපත්‍රය

ඇ. අත්තිකාරම් ගිණුම් කටයුතු සඳහා - අත්තිකාරම් වොරන්ට් බලපත්‍රය

### <u>02.රාජ්‍ය වියදම් සම්බන්ධයෙන් වන කලමනාකරණ වගකීම</u>

දකුණු පළාත් මුදල් රීති **76** අනුව සියළුම ප්‍රධාන ගණන් දීමේ නිළධාරීන් තමා යටතේ වන ආයතන වල මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු කිරීම සම්බන්ධයෙන් වගකීමට බැඳී සිටී. එසේම, **2024** වර්ෂයට අදාල මුදල් ප්‍රකාශය මගින් වෙන් කර දී ඇති පුනරාවර්තන හා ප්‍රාග්ධන ප්‍රතිපාදන සීමාවන් නොඉක්මවන පරිදි වියදම් කළමනාකරණය කර ගැනිමට කටයුතු කිරිම ප්‍රධාන ගණන් දිමේ නිලධාරින්ගේ මෙන්ම ගණන් දිමේ නිලධාරින්ගේද වගකීම වන බව තරයේ අවධාරණය කරනු කැමැත්තෙමි.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary - 091 4944002
කාර්යාලය / காரியாலயம் / Office - 091 4119011, 091 2226118
ෆැක්ස් / பெக்ஸ் / Fax - 091 2246299
විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-mail - chiefsec1@sltnet.lk
වෙබ් අඩවිය / இணையம் / Web site - www.cs.sp.gov.lk
ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretariat, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.

03. 2024 වර්ෂයේ රාජ්‍ය වියදම් කළමණාකරණය

පවත්නා අර්බුදකාරි ආර්ථික තත්වය හේතුවෙන් 2024 වර්ෂයේදි රාජ්‍ය වියදම් දැරීමේදී,රාජ්‍ය මූල්‍ය විනය ඉතා ශක්තිමත්ව පවත්වාගෙන යාමටත්, විචක්ෂණශිලී ලෙස රාජ්‍ය වියදම් කළමනාකරණය කිරීමටත් කටයුතු කිරීම අත්‍යවශ්‍ය වේ. එහිදි රාජ්‍ය වියදම් පාලනය කිරීම සම්බන්ධයෙන් දැනටමත් නිකුත් කර ඇති චක්‍රලේඛ වල සඳහන් වියදම් පාලන උපදෙස් තවදුරටත් දැඩිව පිලිපැදිය යුතු බව අවධාරණය කරමි.

2024 වර්ෂය තුල වියදම් දැරීමේදි පහත සඳහන් ප්‍රමුඛතා අනුපිළිවෙලට කටයුතු කළයුතු වේ.

අ. හිඟ බැඳීම් පවත්වා නොගත යුතු බැවින් හිඟ බිල්පත් ඇත්නම් නිරවුල් කිරීම

ආ. අයවැය යෝජනා නිසි පරිදි කඩිනමින් ක්‍රියාත්මක කිරීම

ඇ. විදේශීය මූල්‍යනය යටතේ ක්‍රියාත්මක,අවසාන අදියරේ පවතින ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

ඈ. දේශීය මූල්‍යනය මඟින් ක්‍රියාත්මක කෙරෙන ප්‍රමුඛතාවයෙන් ඉහළ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

ඉ. ඇස්තමේන්තු මඟින් ප්‍රතිපාදන වෙන් කර ඇති නව බැඳීම් සම්බන්ධයෙන් වන වියදම්.

04. බැඳීම් කළමනාකරණය.

සෑම වියදමක් සම්බන්ධයෙන්ම බැඳීම් ඇති කර ගැනිමට පෙර ඒ සඳහා ප්‍රමාණවත් අයවැය ප්‍රතිපාදන පවතින බව තහවුරු කරගත යුතුය. නිරවුල් නොවු වගකීම් එක්රැස්වීම හේතුවෙන් රජය මෙන්ම කොන්ත්‍රාත්කරුවන්/ සේවා සපයන්නන්, අසීරුතාවයන්ට පත්වීම වැලැක්වීම සඳහා ප්‍රතිපාදන වෙන් වි තිබුණද බැඳීම් ඇතිකර ගැනිමට ප්‍රථම අක්මුදල් ලබා ගැනිමේ හැකියාව තහවුරු කර ගැනිම වැදගත්වේ. අයවැය ප්‍රතිපාදන සළසා ගැනිමකින් තොරව ඇතිකර ගනු ලබන බැඳීම් සඳහා පළාත් භාණ්ඩාගාරයේ වගකිමක් නොමැති බැවින් එවැනි වියදම් සඳහා අදාල නිලධාරින් පෞද්ගලිකව වගකිව යුතුවේ.

2024 වාර්ෂික මුදල් ප්‍රකාශය මගින් ඔබ වෙත වෙන් කර දි ඇති ප්‍රතිපාදන ප්‍රමාණයන්ට අමතරව අතිරේක ප්‍රතිපාදන ලබා දීම සිදු නොකරන බැවින්, 2024 වර්ෂය තුල ලබා දී ඇති ප්‍රතිපාදන නිවැරදිව ප්‍රමුඛතාගත කරමින් මනා ලෙස කළමනාකරණය කර ගැනිමට හැකි සෑමවිටම උත්සාහගත යුතුවේ.

05. අමතර ප්‍රතිපාදන ඉල්ලිම.

පවත්නා අතිශය සීමාකාරි රාජ්‍ය මූල්‍ය අවකාශය හේතුවෙන් වියදම් ශිර්ෂ වෙත වෙන් කර ඇති ප්‍රතිපාදන ඉක්මවා අමතර ප්‍රතිපාදන ලබාදිම ඉතා අසිරු බැවින් 2024 වර්ෂය තුල පැන නගින වියදම් ලබා දි ඇති ප්‍රතිපාදන සීමාව තුල හොඳින් ප්‍රමුඛතාගත කරමින් කළමනාකරණය කරගත යුතුය. අත්‍යාවශ්‍යම කරුණක් සඳහා පමණක් අමතර ප්‍රතිපාදන ඉල්ලීම් කරන්නේ නම් එම ඉල්ලීම් සෑම විටම සාධාරණීකරණ වාර්තාවක් සමඟ ප්‍රධාන ගණන්දිමේ නිලධාරියාගේ නිර්දේශ සහිතව පළාත් භාණ්ඩාගාරය වෙත යොමු කළ යුතුය.

06. දකුණු පළාත් මුදල් රීති 30 යටතේ ප්‍රතිපාදන මාරු කිරිම

දකුණු පළාත් මුදල් රීති 30 යටතේ ප්‍රතිපාදන මාරු කිරීම් සඳහා වන ඉල්ලීම් සිදු කළ යුත්තේ වැය දැරීමට ප්‍රථමයෙන් වන බව අවධාරණය කරමි. වැය විෂයන් වැඩසටහන් ව්‍යාපෘති අතර පුනරාවර්ථන හා ප්‍රාග්ධන වියදම් වෙනුවෙනුත් ප්‍රතිපාදන මාරු කිරිමේදි මු.රී. 30 .1 , 30.2 ,30.3,30.4,30.5, හි විධිවිධානයන් අනුව කටයුතු කළ යුතු වන අතර ප්‍රතිපාදන මාරු කිරිම සඳහා වන ඉල්ලීම මුදල් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පෙර පළාත් භාණ්ඩාගාරයේ අයවැය දෙපාර්තමේන්තුව වෙත යොමු කළ යුතුය.

07. අත්තිකාරම් ගිණුම් කටයුතු.

ගරු ආණ්ඩුකාරතුමන් විසින් අනුමත කර ඇති සීමාවන් තුල අත්තිකාරම් ගිණුම් කටයුතු පවත්වාගත යුතු අතර උපරිම වියදම් සීමාව වැඩි කිරිම සඳහා අවසර ලබානොදෙන බැවින් වරින් වර සමාලෝචනය කරමින් එම සීමාවන් තුලම වියදම් කළමණාකරණය කරගත යුතු වේ. 2024.01.01 දින සිට සියලුම රාජ්‍ය සේවකයින් පෙර පරිදි ආපදා ණය පහසුකම් සඳහා ඉල්ලුම් කිරීමට සුදුසුකම් ලබනු ඇත.

08.පොදු

අතිරේක ප්‍රතිපාදන සහ මුදල් රීති 30 යටතේ ප්‍රතිපාදන මාරු කිරීම් සඳහා අනුමැතිය ඉල්ලීම් පළාත් භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කිරීමේදී, ප්‍රධාන ගණන්දීමේ නිළධාරියාගේ/අමාත්‍යාංශ ලේකම්වරයාගේ අත්සනින් ඉදිරිපත් කළ යුතු බව අවධාරණය කරමි.එවැනි ඉල්ලීමක් භාණ්ඩාගාරය වෙත යොමු කිරීමට පෙර ප්‍රධාන ගණන්දීමේ නිළධාරියා/අමාත්‍යාංශ ලේකම්වරයා විසින් පෞද්ගලිකවම එහි අත්‍යවශ්‍යතාවය සහ අදාළ වියදම් පවතින ප්‍රතිපාදන තුළ කළමනාකරණය කිරීමට ඇති හැකියාව පිළිබඳ සොයා බැලිය යුතු බවද තව දුරටත් දන්වා සිටිමි.

09.පැහැදිලි කරගැනීම

මෙම චක්‍රලේඛය සම්බන්ධයෙන් අවශ්‍ය පැහැදිලි කර ගැනීම් පළාත් භාණ්ඩාගාරයේ අයවැය දෙපාර්තමේන්තුවේ අයවැය අධ්‍යක්ෂ (091-2246902) මඟින් ලබා ගත හැකිය.

සුමිත් අලහකෝන්,

ප්‍රධාන ලේකම්,

දකුණු පළාත.

පිටපත්-

01. ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති දකුණු පළාත - කරු. දැ.ගැ.ස.
02. අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ දකුණු පළාත - කරු. දැ.ගැ.ස.
03. අධ්‍යක්ෂ (ගිණුම් හා ගෙවීම්/ මුදල්/ අයවැය) දකුණු පළාත - කරු. දැ.ගැ.ස.
04. ප්‍රධාන ගණකාධිකාරි. ප්‍රධාන ලේකම් කාර්යාලය දකුණු පළාත - කරු. දැ.ගැ.ස.

විද්‍යුත් ලිපිනය:budget@cs.sp.gov.lk දුරකථන අංකය :091-2246902 Fax: 091-2246902

ආචාර්ය ඩබ්ලිව්. ඩබ්ලිව්. ගමගේ
கலாநிதி டப்லிவ். டப்லிவ். கமகே
Dr. W. W. Gamage
දකුණු පළාත් ආණ්ඩුකාරවර
தென் மாகாண ஆளுநர்
Governor of Southern Province

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No. | G/SP/2/6/03-WP | ඔබේ අංකය<br>உமது இல<br>Your No. | CSS/8/1/1- 2024 | දිනය<br>திகதி<br>Date | 2023.11.30 |

දකුණු පළාත් සභාව

2024 වර්ෂය සඳහා පළාත් සභා අරමුදලින්

මුදල් ඉවත් කර ගැනීමේ අධිකාරී බලය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දකුණු පළාත් සභාවේ හත් වන පළාත් සභා නිල කාලය 2019 අප්‍රේල් මස 10 වන දිනෙන් අවසන් වූ බැවින් 1987 අංක 42 දරණ පළාත් සභා පණතේ 30 වගන්තිය හා 1990 අංක 28 දරණ පළාත් සභා (සංශෝධන) පනතේ 27 (අ) වගන්තිය අනුව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, 2024 වර්ෂය සඳහා වූ දකුණු පළාත් සභා අරමුදලින් මුදල් වියදම් කිරීම සඳහා වන අවසරයයි.

පළමුවන උපලේඛනයේ දැක්වෙන **රුපියල් හයදාස් එකසිය තිස් හය කෝටි හැට දෙලක්ෂයක මුදලක් (රු.61,366,200,000)** 2024 ජනවාරි මස 01 වන දින සිට 2024 දෙසැම්බර් මස 31 වන දින දක්වා පළාත් සභා අරමුදලින් මුදල් ඉවත්කර ගැනීමට දකුණු පළාත් සභාවේ ප්‍රධාන ලේකම් වෙත මෙයින් බලය දෙමි.

මෙම අවසරය දකුණු පළාතේ අටවන පළාත් සභාව කැඳවනු ලබන දිනයේ හෝ පළාත් සභාවේ කටයුතු නැවත ආරම්භ කරන දිනයෙහි හෝ සිට මාස තුනක (03) කාල සීමාවක් ඉකුත් වන දිනය හෝ 2024 දෙසැම්බර් 31 වන දිනය හෝ යන දින දෙකෙන් කලින් එළඹෙන දිනයෙන් අවසන් වන්නේය.

ආචාර්ය ඩබ්ලිව්.ඩබ්ලිව්.ගමගේ
ආණ්ඩුකාරවර,
දකුණු පළාත.
2023 නොවැම්බර් මස 30 වන දින දිය.

ආචාර්ය ඩබ්ලිව්.ඩබ්ලිව්.ගමගේ.
ආණ්ඩුකාරවර
දකුණු පළාත

ආණ්ඩුකාරවර කාර්යාලය, ඩික්සන් පාර, ගාල්ල.
දුරකථන : 091 2234578
ෆැක්ස් : 091 2227228
විද්‍යුත් තැපෑල : governorsp@sltnet.lk

ஆளுநர் அலுவலகம், கீழ் டிக்ஸன் வீதி, காலி.
தொலைபேசி : 091 2234578
தொலைநகல் : 091 2227228
மின் அஞ்சல் : governorsp@sltnet.lk

Governor's Office, Lower Dickson Rd, Galle.
Tel : 091 2234578
Fax : 091 2227228
E-mail : governorsp@sltnet.lk

ආචාර්ය ඩබ්ලිව්. ඩබ්ලිව්. ගමගේ
கலாநிதி டப்லிவ். டப்லிவ். கமகே
Dr. W. W. Gamage
**දකුණු පළාත් ආණ්ඩුකාරවර**
தென் மாகாண ஆளுநர்
Governor of Southern Province




| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எனது இல / My No. | G/SP/2/6/03-WP | ඔබේ අංකය / உமது இல / Your No. | CSS/8/1/1- 2024 | දිනය / திகதி / Date | 2023.11. 30 |

**දකුණු පළාත් සභාව**

**2024 වර්ෂය සඳහා විශේෂ නීති සේවා වෙනුවෙන් පළාත් සභා අරමුදලින්**

**මුදල් ඉවත් කර ගැනීමේ අධිකාරී බලය**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දකුණු පළාත් සභාවේ හත් වන පළාත් සභා නිළ කාලය 2019 අප්‍රේල් මස 10 වන දිනෙන් අවසන් වූ බැවින් 1987 අංක 42 දරණ පළාත් සභා පණතේ 30 වගන්තිය හා 1990 අංක 28 දරණ පළාත් සභා (සංශෝධන) පනතේ 27 (අ) වගන්තිය අනුව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, 2024 වර්ෂය සඳහා වූ දකුණු පළාත් සභා අරමුදලින් මුදල් වියදම් කිරීම සඳහා වන අවසරයයි.

පළමුවන උපලේඛනයේ දැක්වෙන ගරු ආණ්ඩුකාරවර, ගරු සභාපති, ගරු නියෝජ්‍ය සභාපති, ගරු අමාත්‍ය මණ්ඩලය, ගරු විපක්ෂ නායක සහ ගරු පළාත් සභා මන්ත්‍රීන් සඳහා 1987 අංක 42 දරණ පළාත් සභා පනතේ 25 (3) ඡේදයේ හා 1988 අංක 37 පළාත් සභා ( වැටුප් හා දීමනා ගෙවීමේ ) පනතේ 3 ඡේදයට අනුව විශේෂ නීති සේවා යටතේ වැටුප් හා දීමනා ගෙවීම වෙනුවෙන් රුපියල් අට කෝටි අනූ තුන් ලක්ෂ හැත්තෑ තුන් දහස් තුනිසිය හැත්තෑවක (රු.89,373,370) මුදලක් 2024 ජනවාරි මස 01 වන දින සිට 2024 දෙසැම්බර් මස 31 වන දින දක්වා පළාත් සභා අරමුදලින් මුදල් ඉවත්ක කර ගැනීමට දකුණු පළාත් සභාවේ ප්‍රධාන ලේකම් වෙත මෙයින් බලය දෙමි.

මෙම අවසරය දකුණු පළාතේ අටවන පළාත් සභාව කැඳවනු ලබන දිනයේ හෝ පළාත් සභාවේ කටයුතු නැවත ආරම්භ කරන දිනයෙහි හෝ සිට මාස තුනක (03) කාල සීමාවක් ඉකුත් වන දිනය හෝ 2024 දෙසැම්බර් 31 වන දිනය හෝ යන දින දෙකෙන් කලින් එළඹෙන දිනයෙන් අවසන් වන්නේය.

ආචාර්ය ඩබ්ලිව්.ඩබ්ලිව්.ගමගේ
ආණ්ඩුකාරවර,
දකුණු පළාත.
2023 නොවැම්බර් මස 30 වන දින දීය.

**ආචාර්ය ඩබ්ලිව්.ඩබ්ලිව්.ගමගේ**
**ආණ්ඩුකාරවර**
**දකුණු පළාත**


ආණ්ඩුකාරවර කාර්යාලය, ඩික්සන් පාර, ගාල්ල.
දුරකථන : 091 2234578
ෆැක්ස් : 091 2227228
විද්‍යුත් තැපෑල : governorsp@sltnet.lk

ஆளுநர் அலுவலகம், கீழ் டிக்ஸன் வீதி, காலி.
தொலைபேசி : 091 2234578
தொலைநகல் : 091 2227228
மின் அஞ்சல் : governorsp@sltnet.lk

Governor's Office, Lower Dickson Rd, Galle.
Tel : 091 2234578
Fax : 091 2227228
E-mail : governorsp@sltnet.lk

**ආචාර්ය ඩබ්ලිව්. ඩබ්ලිව්. ගමගේ**
கலாநிதி டப்லிவ். டப்லிவ். கமகே
Dr. W. W. Gamage
**දකුණු පළාත් ආණ්ඩුකාරවර**
தென் மாகாண ஆளுநர்
Governor of Southern Province


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No. | G/SP/2/6/03-WP | ඔබේ අංකය<br>உமது இல<br>Your No. | CSS/8/1/1- 2024 | දිනය<br>திகதி<br>Date | 2023.11.30 |

**දකුණු පළාත් සභාව**

**2024 වර්ෂය සඳහා අත්තිකාරම් කටයුතු වෙනුවෙන් පළාත් සභා අරමුදලින් මුදල් ඉවත් කර ගැනීමේ අධිකාරී බලය**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දකුණු පළාත් සභාවේ හත් වන පළාත් සභා නිළ කාලය 2019 අප්‍රේල් මස 10 වන දිනෙන් අවසන් වූ බැවින් 1987 අංක 42 දරණ පළාත් සභා පණතේ 30 වගන්තිය හා 1990 අංක 28 දරණ පළාත් සභා (සංශෝධන) පනතේ 27 (අ) වගන්තිය අනුව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, 2024 වර්ෂය සඳහා දකුණු පළාත් සභාවේ අත්තිකාරම් ගිණුම් කටයුතු සඳහා අවශ්‍ය වේ යැයි තක්සේරු කර ඇති II උපලේඛනයේ වියදම්, දකුණු පළාත් සභා අරමුදලින් දැරීමට දකුණු පළාතේ ප්‍රධාන ලේකම්ට සහ ගණන් දීමේ නිළධාරීන්ට මෙයින් අවසර දෙමි.

මෙම අවසරය දකුණු පළාතේ අටවන(8) පළාත් සභාව කැඳවනු ලබන දිනයේ හෝ පළාත් සභාවේ කටයුතු නැවත ආරම්භ කරන දිනයෙහි හෝ සිට මාස තුනක (03) කාල සීමාවක් ඉකුත් වන දිනය හෝ 2024 දෙසැම්බර් 31 වන දිනය හෝ යන දින දෙකෙන් කලින් එළඹෙන දිනයෙන් අවසන් වන්නේය.

**ආචාර්ය ඩබ්ලිව්.ඩබ්ලිව්.ගමගේ**
ආණ්ඩුකාරවර,
දකුණු පළාත.
2023 නොවැම්බර් මස 30 වන දින දීය.

**ආචාර්ය ඩබ්ලිව්.ඩබ්ලිව්.ගමගේ**
**ආණ්ඩුකාරවර**
**දකුණු පළාත**